**රණවිරු සේවා අධිකාරිය -2012**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට රණවිරු සේවා අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය වෙත බාහිර පාර්ශවයන්ගෙන් සමාලෝචිත වර්ෂය තුළ පරිත්‍යාග වශයෙන් ලැබී තිබූ පරිගණක 05 ක් සහ කෘතිම පාද 16 ක වටිනාකම ගණනය කර ගිණුම්වලට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අධිකාරිය සතු කාර්යාල උපකරණ සහ යන්ත්‍රෝපකරණ වලින් කොටසක් 2012 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර තිබූ අතර ඒ සඳහා ඉදිරිපත් කර නොතිබූ වර්ග 26 කට අදාල භාණ්ඩ 57 ක හා පළාත් කාර්යාලයන්හි තිබූ භාණ්ඩවල පිරිවැය හා සමුච්චිත ක්ෂය වටිනාකම්ද සමග සමස්ත පිරිවැය හා සමුච්චිත ක්ෂය වටිනාකම් සැලකිල්ලට ගනිමින් ප්‍රත්‍යාගණන අලාභය සාවද්‍ය ලෙස ගණනය කර තිබුණි. ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කර නොතිබීම හා වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණ පවත්වා නොතිබීම නිසා එසේ වැඩියෙන් දක්වා තිබූ වත්කම්වල වටිනාකම් වෙනම ගණනය කරගත නොහැකි විය.

### 1.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

සමාජයීය හා සංස්කෘතික සංවර්ධන අංශය යටතේ නිවාස ආධාර වාරික සඳහා ප්‍රතිලාභීන් වෙත ගෙවිය යුතු රු.5,200,000 ක් වර්ෂයකට අධික කාලයක් තිස්සේ නිරවුල් කිරීමකින් තොරව පැවතුනි.

### 1.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තිය | රජයේ සෑම නීතිගත සංස්ථාවක් විසින්ම සෑම මුදල් වර්ෂයක් සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු අතර එය අදාලවන මුදල් වර්ෂය ආරම්භ වීමට මාස තුනකට නොවැඩි කාලයකට පෙර පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවත් අයවැය ලේඛනය පාලක මණ්ඩලයට 2012 පෙබරවාරි 09 වන දින ඉදිරිපත් කර තිබුණ ද අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි (i) 104 (3) | සිදුවූ අලාභහානිය සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කිරීමට දින 07 කට වැඩි ප්‍රමාදයක් සිදුවේ යැයි අපේක්ෂා කරන්නේ නම් එම අලාභහානි සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තාවක් එවිය යුතු වුවත් අධිකාරියේ නැතිවූ පරිගණකයක් හා සිදුවූ වාහන අනතුරක් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ii) 104 (4) | අලාභහානිය සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණයෙන් පසු අලාභහානිය සිදුවූ දිනයේ සිට තුන්මසක් ඇතුළතදී |

| | | |
|---|---|---|
| | | පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් ඉහත (ආ) (i) හි සඳහන් අවස්ථා 2 හිදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.1 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනයෙහි ප්‍රක්ෂේපිත ශේෂ පත්‍රය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා ක්‍රියාකාරි සැලැස්ම ඇතුළත් කර නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 හා 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ සහ 2009 සැප්තැම්බර් 01 දිනැති අංක ඩීඑම්ඒ/02 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛන හා පරිගණක උපාංග ලේඛන නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මාස 06 කට වරක් වාහන වල ඉන්ධන දහනය සම්බන්ධව සිදුකළ යුතු පරීක්ෂා කිරීම් අධිකාරිය විසින් සිදුකර නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.26,090,493 ක්වූ රජයේ දායකය ගණන් ගැනීමෙන් පසු රු.2,294,685 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.21,761,093 ක්වූ රජයේ දායකය ගණන් ගැනීමෙන් පසු රු.11,402,525 ක අතිරික්තයක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,107,840 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට වඩා ව්‍යාපෘති මෙහෙයුම් වියදම් රු.28,395,713 කින් වැඩිවී තිබීමත් අධිකාරියේ කාර්යාලයීය උපකරණ හා යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනය කිරීම

මත රු.4,542,010 ක අලාභය ආදායම් වියදම් ගිණුමට ගලපා තිබීමත් මෙම පිරිහීමට විශේෂයෙන් හේතු වී තිබුණි.

**2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ ආදායම පසුගිය වර්ෂයට වඩා රු.28,698,453 කින් එනම් සියයට 20 කින් වැඩිවී තිබුණි.

(ආ) අධිකාරියේ වියදම පසුගිය වර්ෂයට වඩා රු.37,806,293 කින් එනම් සියයට 29 කින් වැඩිවී තිබුණි.

(ඇ) අධිකාරියේ මුළු ශුද්ධ වත්කම් පසුගිය වර්ෂයේ රු.597,649,668 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී එය රු.594,824,285 දක්වා රු.2,825,383 කින් අඩුවී තිබුණි.

**2.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

සමාලෝචිත වර්ෂය අවසාන වන විට බාහිර පාර්ශවයන් විසින් ආයතනයට එරෙහිව අධිකරණවල නඩු 03 ක් ගොනු කර තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉඩම් බෙදා දීම

ක්‍රියාන්විතයේදී ආබාධිත හා මියගිය රණවිරුවන්ගේ සුභසාධනය සඳහා අධිකාරිය පිහිටුවා ඇති අතර එහිදී ඉඩම් නොමැති රණවිරු පවුල් සඳහා නිවෙස් තැනීමට සුදුසු ඉඩමක් ලබාදීම අධිකාරියේ ප්‍රධාන අරමුණක් වේ. ඒ සඳහා අවශ්‍ය ඉඩම් ප්‍රාදේශීය ලේකම් වෙතින් හා

පෞද්ගලික පරිත්‍යාගශීලීන්ගෙන් ලැබේ. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පනතේ 6 වගන්තියට අනුකූලවන පරිදි ක්‍රියාන්විතයේදී ආබාධිත හා මියගිය රණවිරුවන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන් පිළිබඳව සියළු දත්ත ඇතුළත් සම්පූර්ණ තොරතුරු පද්ධතියක් යාවත්කාලීනව පවත්වාගෙන යාමට අධිකාරිය මෙතෙක් අපොහොසත් වී තිබීම නිසා ඉඩම් බෙදා හැරීමේදී ඒ සඳහා අවශ්‍යතාවය ඇති රණවිරුවන් විනිවිදභාවයකින් යුතුව තෝරා ගත නොහැකි වී තිබුණි.

(ii) විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව රණවිරු සේවා අධිකාරිය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා එක්ව රණවිරුවන් වෙත බෙදා දීමට සැලසුම් කර තිබූ 2004 වර්ෂයේ සිට ලද ඉඩම් සංඛ්‍යාව 17 ක්වූ අතර එයින් බෙදා දී තිබූ ඉඩම් සංඛ්‍යාව 9 ක් පමණි. පෞද්ගලික පරිත්‍යාගශීලීන්ගෙන් 2001 වර්ෂයේ සිට අධිකාරිය වෙත ලද ඉඩම් 06 න් ඉඩම් 03 ක් පමණක් බෙදා දී තිබූ අතර තවත් ඉඩමක් (යාකබැද්ද ඉඩම) අභිමංසලක් ඉදිකිරීම සඳහා යුධ හමුදාව වෙත භාරදීමට තීරණය කර තිබුණි. පොදු ව්‍යාපාර කාරක සභාවේදීද මෙම ඉඩම් බෙදා හැරීමට කටයුතු නොකිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කර තිබුණි.

(ආ) කායික හා මානසික සවිබලගැන්වීමේ අංශය
--------------------------------------------------

කායික හා මානසික සවිබලගැන්වීමේ අංශය මගින් 2012 වර්ෂය තුල මනෝවිද්‍යාත්මක වැඩසටහන් 42 ක්ද, අක්ෂි සායන 21 ක්ද, වෛද්‍ය සායන 10 ක්ද, ආබාධිත රණවිරු පුහුණු වැඩමුළු 05 ක්ද පැවැත්වීම සඳහා සැලසුම් කර තිබුණද, වර්ෂය තුල ක්‍රියාත්මක කර තිබුණේ මනෝවිද්‍යාත්මක වැඩමුළු 11 ක්ද, අක්ෂි සායන 17 ක්ද, වෛද්‍ය සායන 06 ක්ද, අබාධිත රණවිරු වැඩමුළු 04 ක්ද, අබාධිත රණවිරුවන් රැකබලාගන්නන් දැනුවත් කිරීමේ වැඩමුළුවක්ද පමණකි. වර්ෂය ආරම්භයේදී මෙම අංශය වෙනුවෙන් රු.9,330,000 ක් වෙන් කර තිබූ නමුත් වර්ෂය තුලදී වැය කර තිබුණේ රු.5,446,305 ක් පමණි.

(ඇ) සමාජයීය හා සංස්කෘතික අංශය
-----------------------------------

(i) සංසඳ
-------

රණවිරු සංසද නාමය ගෞරවනීය හා අභිමානවත් වන පරිදි දිවයින පුරා තනි පවුල් වශයෙන් විසිරී සිටින රණවිරු පවුල් එක්රැස් කිරීමෙන් මනා සන්නිවේදනයක් ඇති කිරීම හා ඔවුන් සමාජයීය හා අධ්‍යාත්මික වශයෙන් ශක්තිමත් කිරීමේ අරමුණින්

ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් රණවිරුවන්ගේ සහභාගීත්වයෙන් සංසද කමිටු පිහිටුවා තිබුණි. මෙම සංසද කමිටු සම්බන්ධීකරණයේදී පහත අඩුපාඩු දක්නට ලැබුණි.

- මෙම අංශය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් වර්ෂය ආරම්භයේදී සැලසුම් කර නොතිබූ අතර 2012 වර්ෂය තුළ පැවැත්විය යුතු සංසද සම්මේලනයද පවත්වා තිබුණේ 2013 ජනවාරි 09 දිනදීය.
- 2012 අවසාන මාස 06 තුල දිස්ත්‍රික් දැනුවත් කිරීමේ වැඩසටහන් 20 ක් පවත්වා තිබූ අතර ඉන් වැඩසටහන් 14 ක්ම රත්නපුර හා අම්පාර යන දිස්ත්‍රික්ක 2 ට සීමා කර තිබුණි. ඒ අනුව සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා නොතිබූ බව නිරීක්ෂණය විය.
- දිවයින පුරා ව්‍යාප්තව තිබෙන සංසද කමිටු සංඛ්‍යාව 272 කි. පළාත් 08 ක් ආවරණය වන පරිදි පිහිටුවා ඇති එකී කමිටුවල මෙහෙයුම් කටයුතු ක්‍රියාකාරී මට්ටමින් පවත්වාගෙන ගොස් සාමාජිකත්වය රඳවා තබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ඊට අදාල වැඩසටහන් 07 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි.
- ජාතික පළාත් හා ප්‍රාදේශීය උත්සව වෙනුවෙන් රු.1,500,000 ක් ප්‍රතිපාදන වෙන් කර තිබුණි. ඉන් වැය කර තිබුණේ රු.897,441 ක් පමණක් වන අතර එයද 2012 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් වැය කර තිබුණි.

(ii) රණවිරු ගම්මාන

---------------------

රණවිරු නාමය මූර්තිමත් කරන ආදර්ශ ගම්මාන ඇති කරනු පිණිස අධිකාරිය විසින් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කටයුතු කෙරෙන රණවිරු ගම්මාන 39 ක් ඇති අතර එකී අරමුණු ළඟා කර ගැනීමේදී පහත අඩුපාඩු දක්නට ලැබුණි.

- යටිතල පහසුකම් සංවර්ධනය යටතේ පළාතකට එක් ප්‍රජාශාලාවක් බැගින් ප්‍රජාශාලා 08 ක් ඉදිකිරීම සඳහා රු.4,000,000 ක් වෙන් කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඒ වෙනුවෙන් ගෙවීම් කර තිබුණේ රු.742,872 ක් පමණක් වන අතර ප්‍රජාශාලා 04 ක ඉදිකිරීම් කටයුතු පමණක් ආරම්භ කර තිබුණි.
- සමාලෝචිත වර්ෂය තුළ අධිකාරිය විසින් රණවිරු ගම්මාන සම්බන්ධයෙන් සමීක්ෂණ කටයුතු සිදුකර නොතිබූ අතර එම ගම්මාන වල පවතින අඩුපාඩු හා ආධාර ලබාදිය යුතු ආකාරය මෙන්ම පසුගිය වර්ෂවල ලබාදුන් ආධාරවල (ප්‍රජාශාලා ආධාර වැනි) ප්‍රගතිය සම්බන්ධයෙන් පසුවිපරම් කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) නිවාස ආධාර
-----------------

සෑම රණවිරු පවුලකටම ස්ථිර නිවසක හිමිකම ලබාදීමේ අරමුණින් නිවාස ණය වලට අමතරව ක්‍රියාන්විතයේදී ආබාධිත වූ රණවිරුවන්ට, අතුරුදහන් වූ හා මියගිය රණවිරුවන්ගේ ඥාතීන්ට හා යැපෙන්නන්ට නිවාස සැපයීම හා ඒ වෙනුවෙන් සහය වීමක් වශයෙන් වාරික වශයෙන් රු.100,000 ක මුදලක් ලබාදීම මෙම වැඩසටහන මගින් සිදුකෙරේ. මෙහිදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) රණවිරුවන්ගේ තත්ත්වය හඳුනා ගැනීමේ දත්ත පද්ධතිය සම්පූර්ණ ව නොතිබියදී සුහසාධන පහසුකම් ලැබිය යුතු බවට අධිකාරිය මගින් (අධිකාරිය ආරම්භ කර මාස 02 ක් තුල අවසන් කල යුතුව තිබුණි) දැනට අවිධිමත් ලෙස හඳුනා ගෙන ඇති රණවිරුවන් සංඛ්‍යාව 35,099 ක් වූ අතර 2000 සිට 2012 වර්ෂය දක්වා මෙම වැඩසටහන යටතේ 2856 දෙනෙකු සඳහා නිවාස ආධාර ලබාදී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය සඳහා ආධාර ලබාදීමට රු.21,450,000 ක් වෙන් කර තිබුණද ඒ සඳහා උපයෝජනය කර තිබුණේ ප්‍රතිලාභීන් 116 ක් සඳහා රු.13,280,000 ක් එනම් වෙන් කළ මුදලින් 62% ක් පමණි.

(iii) නිවාස ආධාර ලබාදීම වාරික වශයෙන් සිදුකර තිබූ අතර එම වාරික ගෙවීම් කරනු ලබන කාල පරාසයන් නියම කර නොතිබුණි. 2009 වර්ෂයේදී පළමු හා දෙවන වාරික වශයෙන් රු.320,000 ක් ගෙවා තිබූ ආධාර ලාභීන් 06 දෙනෙකුට අදාලව ඉතිරි වාරික වශයෙන් ගෙවිය යුතු රු.280,000 ක මුදල 2013 මාර්තු 31 දින වන විටත් ගෙවා නොතිබුණි. තවද 2010 වර්ෂයේදී ප්‍රතිලාභීන් 20 දෙනෙකුටද 2011 වර්ෂයේදී ප්‍රතිලාභීන් 25 දෙනෙකුටද පිළිවෙලින් රු.800,000 ක් හා රු.1,500,000 ක වාරික ගෙවා ඇතත් අවසාන වාරික වශයෙන් 2010 වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.1,200,000 හා 2011 වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.1,000,000 ක් 2013 මාර්තු 31 දින වන විටත් ප්‍රතිලාභීන් වෙත ගෙවා නොතිබුණි.

(iv) එක් වාරිකයක් ලබාදී බොහෝ කලකට පසුව ඊලග වාරිකය ලබාදෙන බව නිරීක්ෂණය වූ අතර අධිකාරිය මගින් මෙම ආධාර ලබාදීමට අදාලව විධිමත් ක්‍රමවේදයක් සකස් කරගෙන නොතිබීමත්, විධිමත් පරිදි පසුවිපරම් කටයුතු සිදු නොවීමත් ඒ සඳහා හේතු වී තිබෙන බව නිරීක්ෂණය විය.

(ඉ) ණය ලබාදීම
----------------

(i) ආබාධිත හා මියගිය රණවිරුවන්ට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට මූල්‍යමය වශයෙන් සහනයක් සැලසීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ලබාදුන් එක් එක් ණය වර්ගය සම්බන්ධයෙන් භෞතික හා මූල්‍ය ඉලක්කයන් හා ඊට අදාල කාර්ය සාධන තොරතුරු පහත සඳහන් පරිදි විය.

| ණය වර්ගය | | අනුමත | | සත්‍ය | |
|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | මුදල | සංඛ්‍යාව | මුදල |
| | | | රු. | | රු. |
| i | නිවාස ණය | | | | |
| | - සේවයේ නියුතු | 35 | 7,000,000 | 35 | 5,560,000 |
| | - සංසද | 356 | 70,000,000 | 356 | 61,330,000 |
| ii | ගම්මාන | 30 | 1,500,000 | 25 | 1,250,000 |
| iii | ස්වයං රැකියා ණය | 25 | 2,500,000 | 20 | 1,500,000 |
| iv | අධ්‍යාපන | 10 | 500,000 | 5 | 400,000 |
| v | වෛද්‍ය ණය | 10 | 1,000,000 | 3 | 300,000 |
| vi | ත්‍රීවිල් ණය | 200 | 60,000,000 | 93 | 31,300,000 |
| | | 666 | 142,500,000 | 537 | 101,640,000 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- අධිකාරිය ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලබාදී තිබූ ණය සංඛ්‍යාව 5940 ක් වූ අතර ඒ සඳහා රු.937,862,885 ක් වැය කර තිබුණි. එහිදී ලබාදී තිබූ ණය වලින් වැඩි ප්‍රමාණයක් සංසද නිවාස ණය වූ අතර ණය ලාභීන්ට සත්‍ය වශයෙන්ම එම ණය මුදලක අවශ්‍යතාවයක් පවතින්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා සුදුසු දත්ත පද්ධතියක් අධිකාරිය මගින් ස්ථාපිත කර නොතිබුණි. එමෙන්ම ණය ලබාදීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කර නොතිබූ අතර වර්ෂ ගණනාවක සිටම ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් සහතික කරන ලද ඡායාරූපයක් පාදක කරගෙන ලබාදෙන නිර්දේශ මත ණය මුදල් නිකුත් කර තිබුණි.
- පසුගිය වර්ෂයේ ලබාදුන් ණය වලට අදාල වාරික 129 ක් හා සමාලෝචිත වර්ෂයේ ලබාදුන් ණය 436 ක් (අධ්‍යාපන, වෛද්‍ය හා ත්‍රීවිල් ණය හැර) සඳහා 2012 වර්ෂයේදී ගෙවන ලද මුළු මුදල රු.77,505,000 ක් වුවද එයින් පසුවිපරම් කටයුතු සිදුකර තිබුණේ රු.3,500,000 ක් වටිනා නිවාස හා ස්වයං රැකියා ණය 15 ක් සඳහා පමණක් බව නිරීක්ෂණය විය.
- 2010 හා 2011 වර්ෂවලදී අධිකාරිය මගින් ලබාදී තිබූ එකතුව රු.600,000 ක්වූ ණය මුදල් වලින් රු.413,228 ක් හිඟහිට තිබූ අතර 2013 මාර්තු 15 දින වන විටත් එම ණය මුදල් සම්බන්ධයෙන් අවසන් තීරණයකට එළඹීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවස්ථා 14 කදී ලබාගත් රු.1,086,640 ක අත්තිකාරම් වලින් රු.452,880 ක් මුදලින් අධිකාරිය වෙත ආපසු ගෙවා තිබූ අතර ඉතිරි රු.633,760 වෙනුවෙන්ද බිල්පත් ඉදිරිපත් කර නොතිබුණු නිසා තවදුරටත් අත්තිකාරම් ලෙස සලකා ඉදිරියට ගෙනවිත් තිබුණි. තවද අවස්ථා 29 කදී ලබාගත් රු.1,315,340 ක්වූ අත්තිකාරම් පියවීම සඳහා අදාල කාර්යය නිමවී මාස 02 සිට මාස 06 දක්වා වූ කාල පරාසයක් ප්‍රමාද කර තිබුණි.

(ආ) ගබඩා තොග වාර්තා නඩත්තු කිරීම

(i) ගබඩාවට ලැබෙන හා නිකුත් කරන භාණ්ඩ සම්බන්ධයෙන් බින්කාඩ් පත් සහ තොග ලෙජර් නඩත්තු කර නොතිබූ බවත්, ශාඛාවලට නිකුත් කර තිබූ භාණ්ඩ සඳහා ඒ ඒ ශාඛාවල ඉන්වන්ට්‍රි ලේඛන නඩත්තු කර නොතිබූ බවත් නිරීක්ෂණය විය.

(ii) ගබඩාවේ කටයුතු කරගෙන යාම සඳහා ස්ථිර ගබඩා භාරකරුවෙකු පත්කර නොතිබූ අතර එම කටයුතු සිදු කර තිබුණේ පරිගණක සහකාරවරයෙකු විසිනි.

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

(අ) රණවිරු මාපිය රැකවරණ වැඩසටහන

මෙම වැඩසටහන අධිකාරියේ අරමුණුවලට සෘජුව සම්බන්ධ නොවන අතර විශේෂ අනුමැතියක් යටතේ රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් රණවිරුවන්ගේ දෙමාපියන් වෙනුවෙන් මාසිකව රුපියල් 750 බැගින් දිමනාවක් ගෙවීම සඳහා මුදල් ලබාදී තිබුණි. 2012 වර්ෂයේදී ඒ වෙනුවෙන් අධිකාරිය විසින් රු.1,667,250 ක් ගෙවා තිබූ අතර 2013 මාර්තු වන විටත් ඒ යටතේ කිසිදු වාරිකයක් ගෙවා නොතිබුණි.

එසේ වුවද මෙම වැඩසටහනට අදාල ප්‍රාරම්භක උත්සවයේ වැඩ කටයුතු සඳහා අධිකාරියේ වැය විෂයන් 04 කින් මුදල් ලබාගෙන පිළිවෙලින් වේදිකාව සැකසීම

සඳහා රු.740,846 ක්ද, ප්‍රචාරක සැලැස්ම සැකසීම සඳහා රු.7,185,696 ක්ද. පුවත්පත් දැන්වීම් පල කිරීම සඳහා රු.9,315,480ක්ද, ප්‍රවාහන හා අනෙකුත් වියදම් සඳහා රු.2,300,620 ක්ද වශයෙන් රු.19,542,642 ක් වැය කර තිබූ බවත් සෝදිසි පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) රණවිරු දිවි නැගුම යෝජනා ක්‍රමය

මෙම යෝජනා ක්‍රමය යටතේ රණවිරුවන්ට රු.500,000 දක්වා වූ ස්වයං රැකියා ණය මුදලක් බැංකු හරහා ලබා දීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් මුදල් ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාවට නංවා තිබූ අතර මෙම වැඩසටහනට අදාල උත්සවය වෙනුවෙන් හා අනෙකුත් කටයුතු වෙනුවෙන් අධිකාරිය විසින් දැරූ වියදම රු.2,819,635 ක් විය. වර්ෂය ආරම්භයේදී අයවැය ලේඛනය මගින් මේ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර නොතිබුණු අතර රණවිරු සුහසාධනය වෙනුවෙන් වෙන්කළ මුදල් වෙනත් කටයුතු වෙනුවෙන් වැයකර තිබීම අධිකාරියේ අරමුණු වලට පටහැනිව කරන ලද වියදමක් බව නිරීක්ෂණය විය.

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් 2012 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ලේඛනය 2012 සැප්තැම්බර් 14 දිනදීත් 2013 පෙබරවාරි 22 දිනදීත් සංශෝධනය කර තිබුණි. මෙම සංශෝධනය මගින් වර්ෂය ආරම්භයේදී ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර නොතිබූ වැඩසටහන් සඳහා මුදල් ලබා ගැනීම හා ප්‍රතිපාදන වැය නොකළ වැඩසටහන් වලින් ප්‍රතිපාදන අවසන් වී ඇති වැඩසටහන් වලට මුදල් මාරු කිරීම සිදුකර තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යයන් ඉටුවී නොතිබීම නිසා සමාලෝචිත වර්ෂය තුළ අයවැයගත වියදම හා සසඳා බලන කළ අධිකාරියේ පුනරාවර්තන වියදම්වල විචලනය සියයට 10 සිට සියයට 61 දක්වා පරාසයකද ප්‍රාග්ධන වියදම්වල විචලනය සියයට 36 සිට සියයට 98 දක්වා පරාසයකද පැවතිනි.

## 3.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

GB 4742 වාහනය රු.340,760 ක් වැයකර අළුත්වැඩියා කිරීමෙන් පසුව, 2011 අප්‍රේල් 20 දින කාර්යාලයට ගෙනැවිත් තිබුණි. ඉන් පසුව කි.මී. 4500 ක් පමණ ධාවනය කර තිබූ අතර 2011 ජූලි 29 දින සිට නැවත ධාවන කටයුතු සඳහා යොදා ගැනීමට නොහැකි තත්ත්වයට පත්ව තිබූ බැවින් එතැන් සිට භාවිතයට නොගෙන නිෂ්කාර්ය ලෙස කාර්යාල පරිශ්‍රය තුල ගාල් කර තිබුණි.

## 3.6 හඳුනා ගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මොබිටෙල් ජංගම දුරකථන සම්බන්ධතාවය

ලිඛිතව පැවරීමකින් තොරව පරිහරණය කෙරෙමින් පැවති ජංගම දුරකථන සම්බන්ධතාවයක් අස්ථානගත වී තිබූ අතර එයට අදාල මාස 4 ක දුරකථන ගාස්තුව වූ රු.35,294 ක් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවය හඳුනාගැනීමට නොහැකිවීම නිසා අධිකාරිය මගින් එම බිල්පත ගෙවා තිබුණි. තවද බිල්පත් ගෙවීමට පෙර දුරකථන භාවිතා කරන නිලධාරියාගෙන් බිල්පත් නිර්දේශ කරගැනීමේ ක්‍රමයක්ද අධිකාරිය මගින් අනුගමනය කරනු නොලබයි.

(ආ) 2012 ජූනි 24 දින අධිකාරිය සතුව පැවති වාහනයක් අනතුරට පත්ව තිබූ අතර එයින් සිදුවූ අලාභය රු.163,830 ක් වශයෙන් ගණනය කර තිබුණි. වාහනය නියම වටිනාකමට වඩා අඩු වටිනාකමකට රක්ෂණය කර තිබූ නිසා රක්ෂණ සමාගම විසින් අධිකාරිය වෙත ගෙවීමට එකඟවී තිබුණේ රු.63,385 ක් පමණක් වූ අතර ඉතිරි රු.100,445 ක පාඩුව අධිකාරියට දැරීමට සිදුවී තිබුණි.

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදය ප්‍රකාරව වැඩ සඳහා වූ කොන්ත්‍රාත්තු සඳහා කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිමයක් අත්තිකාරම් ලෙස ගෙවිය යුතු වුවත්, වටිනාකම

රු.740,846 ක් හා රු.7,185,696 ක් වටිනා කොන්ත්‍රාත්තු 2 ක් වෙනුවෙන් සියයට 50 බැගින් අත්තිකාරම් ලබා දී තිබුණි.

**3.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

සේවක මණ්ඩල කළමනාකරණය

-------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| විධායක | 24 | 16 | 08 |
| විධායක නොවන | 07 | 07 | - |
| අනෙකුත් | 13 | 13 | - |
| | 44 | 36 | 08 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත සඳහන් තථ්‍ය සේවක සංඛ්‍යාව තුළ ඇති ව්‍යාපෘති කළමනාකරු, නීති නිලධාරි, එක් ව්‍යාපෘති නිලධාරිවරයෙකු හා එක් කාර්යාල කාර්ය සහායකවරයෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් විය. පරිපාලන නිලධාරි හා ගණකාධිකාරි තනතුරු පුරප්පාඩුව පවතින අතර ඒ හේතුවෙන් අධිකාරිය තුළ පරිපාලන හා මූල්‍ය කටයුතු නිසි ක්‍රමවේදයකින් තොරව සිදුවන බව නිරීක්ෂණය විය.

(ආ) අධිකාරියේ සේවක මණ්ඩලයේ එකිනෙක නිලධාරීන් සඳහා තමාගේ තනතුරට අදාලව ලිඛිත වැඩ පැවරීමක් සිදුකර නොතිබුණි.

(ඇ) සමහර නිලධාරීන් තම පත්වීම ලද තනතුරට අදාල රාජකාරිවලින් පරිබාහිරව වෙනත් රාජකාරි වලට යොදවා තිබුනි.

(ඈ) පරිපාලන නිලධාරියෙකු බඳවාගෙන නොමැති අතර පෞද්ගලික ලිපිගොනු නඩත්තුව ඇතුලු අනෙකුත් පරිපාලන කටයුතු මිලදී ගැනීම්වලට අදාල කටයුතු , ගබඩාව හා ප්‍රවාහන අංශයේ කටයුතු, පාලන අංශයට අනුයුක්තව සිටින පරිගණක සහකාරවරයෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකර තිබුණි.

(ඉ) විගණනයට භාජනය කෙරුණු ලිපිගොනු අතරින් නිලධාරින් පස් දෙනෙකුගේ පෞද්ගලික ලිපිගොනු අල්ලස් කොමිෂම වෙත භාරදී ඇති බව දැක්වෙතත් එලෙස භාරදුන් බවට ලිඛිත සාක්ෂි නොවිනි.

(ඊ) පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි වලට පටහැනිව නිලධාරීන් 06 දෙනෙකු සඳහා වැටුප් වර්ධක ගෙවා තිබුණි.

(උ) 2007 දෙසැම්බර් 28 දින සිට වැඩ තහනමට ලක්ව තිබූ අධිකාරියේ ගණකාධිකාරි තනතුරෙහි රාජකාරි කළ නිලධාරිනිය සම්බන්ධයෙන් සිදු කළයුතු අභ්‍යන්තර විනය පරීක්ෂණ කටයුතු 2012 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි. 2004 දෙසැම්බර් 15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 6/2004 අනුව යම් කිසි නිලධාරියෙකුගේ වැඩ තහනම් කළ දින සිට වසරක් ඇතුළත අදාල විනය පරීක්ෂණ කටයුතු අවසන් කර විනය නියෝගයක් නිකුත් කිරීමට පියවර ගතයුතු බව දැක්වෙතත් වැඩ තහනම් කර වර්ෂ 5 ක් ඉක්ම ගොස් ඇතත් එකී කටයුතු අවසාන කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. වැඩ තහනම් කළ දින සිට නිලධාරිනියට මාසිකව අඩ වැටුප් ගෙවනු ලබන අතර 2012 දෙසැම්බර් වන විට එසේ රු.844,080 ක් ගෙවා තිබුණි.

### 3.9 සේවක පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන වෙනුවෙන් අරමුදලක් ගොඩනැගීම

2012 දෙසැම්බර් 31 දින වන විට අධිකාරියේ මුළු පාරිතෝෂිත වෙන් කිරීම රු.5,780,435 ක් වුවද එය ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති හා පීඊඩී/12 චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව 2013 පෙබරවාරි 28 දිනට පෙර ඉදිරිපත් කළ යුතු 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණේ මාස 8 ක් ඉකුත් වී 2013 නොවැම්බර් 21 දිනදීය. එසේ වූවත් කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් සමග ඉදිරිපත් කර නොතිබුණි.

### 4.2 සංයුක්ත සැලැස්ම

2012-2017 වර්ෂ වෙනුවෙන් සකසා තිබූ සංයුක්ත සැලැස්ම 2003 ජූනි 02 දිනැති පීඊඩී/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව පහත කරුණු ඇතුළත් වන පරිදි සකසා නොතිබුණි.

i ආයතනයේ දැනට ඇති සම්පත්

ii සංවිධාන සැලැස්ම

iii පසුගිය වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල විශ්ලේෂණය

iv සැලසුම්ගත කාලපරිච්ඡේදය තුළ සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන අරමුණු හා ඉලක්කයන්ට වගකිව යුතු පාර්ශවයන් පැහැදිලිව හඳුනා ගනිමින් සකස් කරන ලද ක්‍රියාකාරි සැලැස්ම

**4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 ඡේදය ප්‍රකාරව අධිකාරිය විසින් 2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.

**4.4 අයවැය පාලනය හා ක්‍රියාකාරී සැලැස්ම**

සංයුක්ත සැලැස්මේ ප්‍රවර්තන වර්ෂයට අදාල ඉලක්ක සපුරාලීම සඳහා අයවැය ප්‍රතිපාදන සලසා ගතයුතු වන අතර එම අරමුදල් වර්ෂය තුළ උපයෝගි කර ගන්නා ආකාරය හා මූල්‍ය හා භෞතික ඉලක්කවල වගකීම නිශ්චය කොට කාලීනව තථ්‍ය ශේෂයන් සමග සසඳා අවශ්‍ය සංශෝධන සහිතව අවශ්‍ය ඉලක්ක කරා මෙහෙයවිය යුතු වුවද එවැනි අයවැය පාලනයක් ආයතනය තුළ ක්‍රියාත්මක නොවිනි.

**4.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.3 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂයක් අවසාන වී දින 150 ක් ඇතුළත අධිකාරියේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව හා ගිණුම් පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් අධිකාරියේ 2011 වර්ෂයට අදාල වාර්ෂික වාර්තාව 2013 මාර්තු 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**4.6 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ**

2012 නොවැම්බර් 15 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභාවේදී අධිකාරිය වෙත දී තිබූ නියෝග ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පහත පරිදි විය.

ක්‍රියාන්විතයේදී මියගිය, අතුරුදහන් හා ආබාධිත තත්ත්වයට පත්වූ රණවිරුවන් හා විශ්‍රාමික රණවිරු සාමාජිකයන් හා ඔවුන්ගේ යැපෙන්නන් පිළිබඳ තොරතුරු හා රණවිරුවන් වෙනුවෙන් අධිකාරිය ලබාදුන් විවිධ ප්‍රතිලාභ පිළිබඳ තොරතුරු ක්ෂණිකව ලබාගත හැකි ලේඛන හෝ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමේ කාර්යය 2013 මාර්තු 20 දින වන විටත් අවසන් වී නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

පහත සඳහන් පද්ධති හා පාලන දුර්වලතාවයන් විගණනයේදී නිරීක්ෂණය වූ බැවින් එම පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් කළමනාකාරීත්වයේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) ගිණුම්කරණය

(ආ) මානව සම්පත් කළමනාකරණය

(ඇ) ලේඛන පවත්වා ගෙන යාම

(ඈ) කාර්ය සාධනය

(ඉ) අයවැය පාලනය